# 24 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම හා දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර



24.1 රූපය - දිව්‍ය සත්ප්‍රසාද කරඬුව

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජීවමානව වැඩ සිටිනා බව කතෝලික අපගේ විශ්වාසය යි. එය දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයන් තුළින් ද සනාථ වී ඇත. එමගින් අපගේ උතුම් ම වන්දනාව උන් වහන්සේට පුද කරනු ලැබේ. හැකි සෑම විට ම දේවස්ථානයට පැමිණ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකින්නේ ද එබැවිනි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීමේ තවත් පරමාර්ථ ඇත:

- දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටින ජීවමාන ජේසුස් වහන්සේට අපගේ වන්දනාව සහ ආදරය පුද කිරීමට
- යාච්ඤාව තුළින් උන් වහන්සේ හා ගැඹුරු සබඳතාවක් පවත්වා ගෙන යාමට
- අපගේ ආධ්‍යාත්මික හා ලෞකික අවශ්‍යතා ඉල්ලා ගැනීමට
- අපගේ ජීවිතයේ ජයග්‍රහණ හා දුක්වේදනා උන් වහන්සේ හමුවේ තැබීමට
- අපට ලැබුණා වූ සියලු දේව වරප්‍රසාදවලට තුති පිදීමට.

## දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකිය හැකි අවස්ථා

- හැකි සෑම අවස්ථාවක දීම
- දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවා ඇති විට

- දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පවත්වන විට
- දේවස්ථානයක් අසලින් යන සෑම අවස්ථාවක ම
- අපගේ අවශ්‍යතා උන් වහන්සේ හමුවේ තබන විට.

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට අපගේ උතුම් ගෞරවය හා ආදරය පුද කිරීමට යොමු වන අප හැකි සෑම විට ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීමට ද උන් වහන්සේ තුළින් ආධ්‍යාත්මික නවෝදයක් ලබා ගැනීමට ද උනන්දු විය යුතු ය.

## දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට අපගේ වන්දනාව පුද කිරීමටත් උන් වහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීමටත් දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර පැවැත්වේ. දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර පැවැත්වීමේ තවත් අරමුණක් නම් උන් වහන්සේගේ ආශිර්වාදය අප ජීවත් වන ග්‍රාමයටත් එහි වැසියන්ටත් ලබා ගැනීම යි. මෙවන් උතුම් පරමාර්ථ මුල් කරගනිමින් පවත්වනු ලබන දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර සංවිධානය කිරීමට අප දායක විය යුතු ය. ඒ සඳහා පහත සඳහන් දෑ කළ හැකි යː

- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන වීදි සංචාරය කරනා රථය අලංකාර කිරීම
- ගීතිකා පුරුදුවීම්වලට දායක වීම
- දේවස්ථානය හා වීදි මාර්ගය අලංකාර ලෙස සකස් කිරීම.

දේවස්ථානයෙහි දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කරඬුවෙහි වැඩම කර ඇති විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දෙදණ හා හිස නමා වන්දනා කළ යුතු ය.

දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරට සහභාගී වන අප

- පෙරහැරට පෙර පැවැත්වෙන දිව්‍ය පූජාවට හා ශුද්ධ වූ පැයකට සහභාගී වීමට
- පෙරහැරේ දී ගයන ගීතිකා හා යාච්ඤාවලට සහභාගි වීමට
- අනවශ්‍ය කතාබහෙන් වැළකීමට
- පිළිවෙළකට ගමන් කිරීමට (දෙදෙනා හෝ තිදෙනා බැගින්)
- සරල චාම් වස්ත්‍රයෙන් සැරසි සහභාගී වීමට සිත්හි තබා ගත යුතු ය.

අපගේ දෙව් මැදුරේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කර තිබෙන නිසා උන් වහන්සේට අගෞරවය වන පරිදි නොහැසිරිය යුතු ය. එබැවින්,

- දේවස්ථානය තුළ නිශ්ශබ්දතාව සුරැකීමට
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට දණ නමා නමස්කාර කිරීමට
- උන් වහන්සේ අභියස යාච්ඤාවෙහි සහ භාවනාවෙහි නිරත වීමට
- දේවස්ථානය ඇතුළත සංවර ලෙස ගමන් කිරීමට අප යොමුවිය යුතු ය.

**ක්‍රියාකාරකම**

1. කතෝලික අප දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකිනා අවස්ථා **තුනක්** ලියන්න.
2. දිව්‍ය සත්ප්‍රසාද පෙරහැර සංවිධානයේ දී ඔබට දායක විය හැකි ආකාර **තුනක්** ලියන්න.
3. දෙව්මැදුර තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තැන්පත් කර ඇතිවිට හැසිරිය යුතු ආකාර **තුනක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

*දේවස්ථානයක් අබියසින් ගමන් ගන්නා සෑම විටක දී ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදකිමු.*